## **“සොබා චලන සිතුවම්” කෙටි චිත්‍රපට තරඟාවලිය 2022**

2022 ජුනි 05 දිනට යෙදෙන ජගත් පරිසර දිනය නිමිත්තෙන් මෙම තරඟය සංවිධානය කර ඇත.

- **තේමාව** - පරිසරය පිළිබඳව ඕනෑම තේමාවක් ඔස්සේ නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

## **තරඟ කොන්දේසි**

- **කාලය** - උපරිම විනාඩි 05කි.
- **තරඟ අංශ (02)** - ප්‍රබන්ධ සහ වාර්තාමය
- **මාධ්‍ය** - සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවෙන් නිර්මාණ ඉදිරිපත් කල හැකි අතර සිංහල, දෙමළ යන භාෂාවෙන් සිදු කරන නිර්මාණ සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් උපසිරැසි යෙදිය යුතුය. (දෙබස් රහිත නම් මෙම කොන්දේසිය අදාළ නොවේ.)
- **තාක්ෂණික පිරිවිතර** -
    - රූගත කිරීම සඳහා සුදුසු ඕනෑම මෙවලමක් භාවිතා කළ හැකිය. (උදා: ජංගම දුරකතනයක් මඟින් රූගත කළ නිර්මාණයක් වුවද ඉදිරිපත් කළ හැකිය.)
    - එසේ වුවද අවසන් නිෂ්පාදනය පුළුල් තිරයකට ප්‍රක්ෂේපණය කිරීමට සුදුසු වන උසස් තීව්‍රතාවයකින් ( High Resolution) යුක්ත විය යුතුය.
- **නිර්මාණ ඉදිරිපත් කිරීම** -
    - එක් අයදුම්කරුවෙකුට නිර්මාණ එකකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කළ හැකිය.
    - එක් එක් නිර්මාණය වෙනුවෙන් වෙන් වූ දත්ත ගොනුවක් (Data file) ලෙස සංගත තැටියකින් (DVD) පිටපතක් ලබා දිය යුතුය.
    - ඔබගේ නිර්මාණ පහත විද්‍යුත් තැපැල් ලිපිනයට ද යොමු කළ හැකිය.

      sobachalana2014@gmail.com

- **බුද්ධිමය දේපල සම්බන්ධ කොන්දේසි** -
    - නිර්මාණයේ අන්තර්ගතය සම්බන්ධ සම්පූර්ණ වගකීම නිර්මාණකරු සතුවේ.
    - නිර්මාණය සඳහා කර්තෘ හිමිකම්වලින් නිදහස් (Royalty free) හෝ විවෘත අධ්‍යාපනික සම්පත් (Open Educational Resources) වශයෙන් පවත්නා සංගීතය හෝ ශබ්ද යොදා ගන්නේ නම් චිත්‍රපටය අවසානයේදී එසේ ලබාගත් මූලාශ්‍රයන් සඳහන් කළ යුතුය.
- **අවසන් හිමිකම**
    - මෙම තරඟයට ඉදිරිපත් කරන චිත්‍රපට සුදුසු අවස්ථාවන්හි ප්‍රදර්ශනය කිරීමේ සහ ප්‍රදර්ශනය සඳහා ආයතන වෙත ලබා දීමේ අයිතිය පරිසර අමාත්‍යාංශය සතු වේ.
- **වෙනත් කොන්දේසි**

- නිර්මාණකරුවන් ඔවුන්ගේ සැබෑ නම යටතේ පමණක් චිත්‍රපට ඉදිරිපත් කළ යුතුය.
- නිර්මාණයේ අයිතිය මුල් හිමිකරු සතුවිය යුතු අතර, ප්‍රකාශන හිමිකම් කඩ කිරීම නිර්මාණ ප්‍රතික්ෂේප කිරීමට හේතුවකි.
- තරඟයේ විනිශ්චය කටයුතු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඬුල්ලක් විසින් සිදු කරන අතර, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

❖ **ත්‍යාග -**

| | | |
|---|---|---|
| | 1 වෙනි ස්ථානය | - රු.50,000.00 |
| | 2 වෙනි ස්ථානය | - රු.40,000.00 |
| | 3 වෙනි ස්ථානය | - රු.30,000.00 |
| | කුසලතා සම්මාන 06 | - රු.10,000.00 |

❖ පළමු, දෙවන සහ තෙවන ස්ථාන සඳහා මුදල් ත්‍යාගයට අමතරව සම්මානයක්ද, කුසලතා සම්මාන ජයග්‍රාහකයින්ට සමරු තිළිණයක් ද, ප්‍රදානය කෙරේ.

❖ සියළුම සහභාගී වන තරඟකරුවන් සඳහා වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

❖ නිර්මාණ භාර ගැනීමේ අවසන් දිනය -**2022.05.27**

❖ අයදුම් පත්‍ර සහ වැඩි විස්තර සඳහා -

- වෙබ් අඩවිය www.env.gov.lk
- ෆේස්බුක් පිටුවhttps://www.facebook.com/sobachalana.sithuwam
- විද්‍යුත් තැපැල - sobachalana2014@gmail.com
- දුරකතන - 011-2034175